# ක්‍රිස්තියානි ධර්මය

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය 2015

පසුගිය විභාග ප්‍රශ්නෝත්තර

2015 දෙසැම්බර්



ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසමේ ප්‍රකාශනයකි

## ලකුණු දීමේ පටිපාටිය

### 1 වන පත්‍රය

ලකුණු

(1) 1 වන පත්‍රය සඳහා ප්‍රශ්න 40 x 1 බැගින් = 40

### 11 වන පත්‍රය

(2) 1 වන ප්‍රශ්නය අනිවාර්ය වේ.

එහි එක් කොටසකට ලකුණු 02 බැගින් = 20

සෙසු තෝරා ගත් ප්‍රශ්න වලට ලකුණු පිරිනැමිය යුත්තේ

| | | ලකුණු |
|---|---|---|
| සෑම ප්‍රශ්නයක්ම | අ) | 02 |
| | ආ) | 03 |
| | ඉ) | 05 |
| | | 10 |

තෝරා ගත් ප්‍රශ්න 4ට ලකුණු 10 බැගින් = 40

11 වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60කි

මුළු ලකුණු සංඛාව = 100

## ලකුණු දීමේ පටිපාටිය - 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| (01 | 4 | (11 | 2 | (21 | 3 | (31 | 2 |
| (02 | 3 | (12 | 1 | (22 | 1 | (32 | 1 |
| (03 | 2 | (13 | 1 | (23 | 1 | (33 | 3 |
| (04 | 1 | (14 | 4 | (24 | 4 | (34 | 1 |
| (05 | 1 | (15 | 3 | (25 | 3 | (35 | 2 |
| (06 | 3 | (16 | 4 | (26 | 1 | (36 | 1 |
| (07 | 2 | (17 | 2 | (27 | 2 | (37 | 4 |
| (08 | 4 | (18 | 1 | (28 | 4 | (38 | 4 |
| (09 | 3 | (19 | 2 | (29 | 1 | (39 | 3 |
| (10 | 1 | (20 | 3 | (30 | 4 | (40 | 2 |

**අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2015**

**දෙසැම්බර්**

**ප්‍රශ්න හා පිළිතුරු**

**ක්‍රිස්තියානි ධර්මය 1 හා 11**

**සැලකිය යුතුයි**

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4), යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාන්න.

(1) අර්ථවත් නත්තලක් ගත කිරීම සඳහා,

(1) එළිමහන් බැති ගී සංදර්ශන පැවැත්විය යුතුයි.
(2) නිවෙස් වල ගවලෙන් නිර්මාණය කළ යුතුයි.
(3) මිතුරු මිතුරියන්ට නත්තල් පත් යැවිය යුතුයි.
(4) අවශ්‍යතා ඇති දරුවන් සතුටු කළ යුතුයි.

(2) "මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නටද ගළවා ගන්නටද වැඩම කළ සේක."මෙම ජේසු ප්‍රකාශය හා බැඳෙන්නේ,

(1) ධනවත් ප්‍රධානියාගේ කථාවයි
(2) ලෙවී කැඳවීමේ කථාවයි
(3) සාකෙවුස්ගේ කථාවයි
(4) ශතාධිපතියාගේ කථාවයි

(3) ස්නාවක ජොහාන්ගේ දේශනා අද සමාජයේ යථාර්ථයක් කිරීමට නම් කිතුනුවා,

(1) විවිධාකාර භේද පිටුදැකිය යුතුය.
(2) ධනාත්මක සමාජ පරිවර්තනයකට දායක විය යුතුය.
(3) මුදල් රැස් කිරීමට විරුද්ධ විය යුතුය.
(4) සමාජ ප්‍රභූන් විවේචනයට ලක් කළ යුතුය.

(4) දේව රාජ්‍යයේ වර්ධනය දේව බලයෙන් සිදුවන බව පැහැදිලි කරන්නේ,

(1) මුහුන් පිළිබඳ උපමාවයි
(2) අත්තික්කා ගස පිළිබඳ උපමාවයි
(3) දැල පිළිබඳ උපමාවයි
(4) වපුරන්නා පිළිබඳ උපමාවයි

(5) පැරණි ගිවිසුමේ දුක්විඳින සේවකයා යන්න මුලදී යොදා ඇත්තේ,

(1) ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වීමටය
(2) මිසරයේ වහල් සේවකයින් හැඳින්වීමටය
(3) දුක්විඳි දිවැසිවරුන් හැඳින්වීමටය
(4) ජේසුස් වහන්සේ හැඳින්වීමටය

(6) කිතුනු දරුවකු වන ඔබට අසරණ වූ දරුවෙකුට කළ හැකි උතුම් සත්කාරය නම්,

(1) ඔහුගේ සියලු අවශ්‍යතා සපයා දීම
(2) සුබසාධක මධ්‍යස්ථානයකට භාරදීම
(3) සහෝදරත්වයෙන් නිවසට කැඳවා ගැනීමයි
(4) මිතුරු මිතුරියන්ට හඳුන්වා දීමයි

(7) එළිසබෙත්ගේ විශිෂ්ට චරිතාංගයක් නම්,

(1) සියල්ල උපේක්ෂාවෙන් දැරීමයි
(2) හඬක් නැගිය යුතු විට හඬක් නැගීමයි
(3) වැඩිහිටි අදහස් වලට ගරු කිරීමයි
(4) දේව කැමැත්තට ඉඩ දී කිසිවක් නොකර සිටීමයි

(8) කිතුනු බව්තිස්මය ලබා ඇති ඔබ විශේෂයෙන්ම,

(1) කිතුනු සභාවේ සමාජිකත්වය ලැබූවෙහි ය.
(2) සම්පූර්ණ පවිත්‍රතාවක් ලැබූවෙහිය
(3) මනස්ථාපනයට යොමු වූයෙහිය
(4) ශුද්ධාත්ම අනුහසට විවෘත වූයෙහිය

(9) කිලිනොච්චි වැසියන්ට කරුණාව පාමින් ප්‍රේමය දැක්වූයේ,

(1) බෙකර් සොහොයුරියයි
(2) ඉව්ලින් කානි සොහොයුරියයි
(3) මියුරියල් හචින්සන් සොහොයුරියයි
(4) ගරු තම්බිරාජා පියතුමායි

(10) "නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්නැයි."ජේසුතුමා පවසන්නේ,

(1) ලෞකිකත්වයට වහල් වූවන්ටය
(2) හාස්කම් පසුපස දුවන්නන්ටය
(3) සත්‍යය හා යුක්තිය පිටුදකින්නන්ටය
(4) විනය විරෝධී ක්‍රියා කරන්නන්ටය

(11) ජීවමාන ජේසුස් වහන්සේ ගැන කිතුනුවා සාක්ෂි දැරිය යුතු වන්නේ,
(1) ශුභාරංචිවල සඳහන් ජේසු උත්ථානය ගැන පැවසීමෙනි.
(2) තම ජීවිත වෙනස්වීම් තුළින් කිතුනු ආකල්ප ක්‍රියාවට නැංවීමෙනි
(3) දේව දූතයන් කාන්තාවන්ට පැවසූ වදන් සන්නිවේදනය කිරීමෙනි
(4) රෝම ශතාධිපතියාගේ සාක්ෂිය කියා පෑමෙනි

(12) කමාව පිළිබඳ අදහස් කීපයක් පහත දැක්වේ.

A. කමාව යැදීමට පෙර කමාව පිදිය යුතුය

B. සීමා රහිතව කමාව දීමට උත්සුක විය යුතුය

C. සුළු වැරදිවලට කමාව නොයැදිය යුතුය

D. වරද ප්‍රසිද්ධියේ පෙන්වා දී කමාව පිදිය යුතුය

මින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(13) ස්භාවික ව්‍යසන ඇති වීමට වඩාත් ප්‍රබල හේතුවක් වන්නේ,
(1) අවිචාරවත් අත්මාර්ථකාමී මානව ක්‍රියා පිළිවෙත්ය
(2) දෙවිඳුන්ට විරුද්ධ ව ක්‍රියා කිරීමය
(3) තාක්ෂණික උපකරණ බහුලව භාවිතා කිරීමය
(4) ලොව පුරා කම්හල් වැඩි වීමය

(14) කිතුනු සභාවට ඇති අභියෝග ජයගැනීමට මුල් කිතුනු සභාවේ මග පෙන්වීම නම්,

(1) මුල් හැසිරීම් රටාවෙන් නව මගකට පිවිසීමයි
(2) කිතුනුවන්ට පමණක් උපකාර කිරීමයි
(3) වගකීම් හඳුනා ගැනීමට තැත් කිරීමයි
(4) හවුල් නායකත්වයෙන් ප්‍රශ්න විසඳීමයි

(15) පන්දහසකට කන්න දීම තුළින් හෙළිවන ප්‍රධාන දේව ධාර්මික සත්‍යය නම්,

(1) භෞතික අවශ්‍යතා වලට ප්‍රමුඛත්වය දිය යුතු බවයි
(2) ආර්ථික ප්‍රශ්න විසඳීමට ආශ්චර්යයන් අවශ්‍ය බවයි
(3) දේව සංරක්ෂණය කෙරේ විශ්වාසය තැබිය යුතු බවයි
(4) සැලසුමකට අනුව ආහාර බෙදා දිය යුතු බවයි

(16) ජේසුතුමාගේ රූප විපර්යාසය මගින් ගෝලයන්ට අවබෝධ වූයේ,

(1) එතුමාගේ දුක්විඳීමයි (2) එතුමාගේ විනිශ්චයයි
(3) එතුමාගේ ප්‍රේමයයි (4) එතුමාගේ දේව ස්භාවයයි

(17) කිතුනු ඒකත්වයේ අභියෝගයන්ට මුහුණ දෙන අප,

(1) විවිධත්වය නොසළකා හැරිය යුතුය
(2) හිස වන ක්‍රිස්තුස් වහන්සේ තුළ එකම රැළක් විය යුතුය
(3) තමන්ගේ සම්ප්‍රදායික වත් පිළිවෙත් ගැන උදම් ඇණිය යුතුයි
(4) අන්‍යාගමිකයින් පිටු දැකිය යුතුයි

(18) පරිසිවරයාගේ හා අයකැමියාගේ උපමාවේ, අයකැමියාගෙන් ඔබ චරිතායනය කළ යුත්තේ,

(1) පසුතැවිල්ලෙන් තම අනන්‍යතාවය පිළිගැනීමේ චරිත ලක්ෂණයයි
(2) තමා ගැන අධිතක්සේරුවක යෙදීමේ චරිත ලක්ෂණයයි
(3) අන්‍යයන් හා තමා සැසඳීමේ චරිත ලක්ෂණයයි
(4) තම පෞරුෂත්වය ගොඩනැගීමට තැත් කිරීමේ චරිත ලක්ෂණයයි

(19) ජීවිත පෙරළියෙන් පසු පාවුල්ගෙන් දිස් වූයේ,

(1) පුරවැසිභාවය අත්හැර දැමීමය (2) දේවමඟ පෙන්වීමෙන් තීරණ ගැනීමය
(3) ජුදෙව්වන් ප්‍රතික්ෂේප කිරීමය (4) පරිසි නීතියට වහල් වීමය

(20) ජුදෙව් මෙසියස් බලාපොරොත්තුව ඉක්මවූ ජේසුස් වහන්සේ අනුගමනය කරන ඔබ

(1) මුළුමනින්ම දේශපාලනයෙන් බැහැර විය යුතුය (2) මෙසියානු සංකල්පය නිර්වචනය කළ යුතුය
(3) පූර්ණ විමුක්තිය කරා ගමන් කළ යුතුය (4) විමුක්තිය සඳහා සටන් පාඨ පැවසිය යුතුය

(21) ඔබේ ප්‍රදේශයේ අන්‍යාගමික සිද්ධස්ථානයක් ප්‍රතිසංස්කරණය කිරීමේදී ඔබ,

(1) දේවගැතිතුමාගේ අවසරය මත ඊට සහභාගී විය යුතුය
(2) රහසින් ගොස් ඊට සහභාගී විය යුතුය
(3) කිතුනු අනන්‍යතාවය රැකගෙන ඊට සහභාගී විය යුතුය
(4) අන්‍යාගමික කටයුත්තක් නිසා ඊට සහභාගී නොවිය යුතුය

(22) පිලාත් ආණ්ඩුකාරයා ඉතිහාසයට එක්වූයේ,

(1) යුක්තියට පිටුපා තනතුරු රැකගන්නෙකු ලෙසය
(2) නිවැරදි දේ කිරීමට ආත්ම ශක්තියක් නැත්තෙකු ලෙසය
(3) ජන හඬට සවන් නොදුන්නකු ලෙසය
(4) හෙරෝද්ට ත්‍යාග යැවූ කෙනෙකු ලෙසය

(23) නඟුලට අතතබා ආපසු නොබලන්නා,

(1) තිර අදිටනින් සේවය ඉදිරියට ගෙන යන්නෙකි
(2) සියල්ලන්ගේ ආශිර්වාදයෙන් දේව රාජ්‍යය පතළ කරන්නෙකි
(3) ලෞකික ජීවිත රටාවෙන් සමු ගන්නෙකි
(4) පරිණත වූ පසු සේවය අරඹන්නෙකි

(24) නොමඟ ගිය කෙනෙකු ඔබ වෙත පැමිණියොත් ඔබ කළ යුත්තේ,

(1) නොමඟ යෑමට බලපෑ හේතු විමසීමයි
(2) පසුතැවිලි වීමේ වටිනාකම පහදා දීමයි
(3) දේවගැතිතුමා වෙත යොමුකිරීමයි
(4) අසීමිත දේව ප්‍රේමයෙන් පිළිගැනීමයි

(25) ධනවතුන් විසින් දිළිඳුන් නොසැළකීමේ වරද ජේසුතුමා පෙන්වා දුන්නේ,

(1) ධනවත් ප්‍රධානියා පිළිබඳ කථාවෙනි (2) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවෙනි
(3) පොහොසතා සහ ලාසරුස් පිළිබඳ උපමාවෙනි (4) රන්කාසි දසය පිළිබඳ උපමාවෙනි

(26) දේවස්ථාන ආශ්‍රිතව කෙරෙන ක්‍රියාකාරකම් කීපයක් පහත දැක්වේ.

A. අරමුදල් තර කිරීම සඳහා සල්පිලක් හා සැණකෙළියක් පැවැත්වීම

B. නිරාහාර යාච්ඤාවකින් පසුව සංග්‍රහයක් භුක්ති විඳීම

C. අනවශ්‍ය ස්ථාන වල දී ආත්ම ප්‍රබෝධන මෙහෙයන් පැවැත්වීම

D. දේව මෙහෙයන්ට දේශීය තූර්යවාදනය යෙදීම

මෙයින් දේවස්ථාන ආශ්‍රිතව කිරීමට නුසුදුසු ක්‍රියාකාරකම් වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(27) අනුන් වෙනුවෙන් වැයවීම ක්‍රියාත්මක වූ අවස්ථාවක් නම්,

(1) යම් කෙනෙකු මුළු දිනයේම තම කුඹුරේ වැඩ කිරීමයි
(2) මඟදී හමු වූ අසාධ්‍ය රෝගියෙකු රොහල් ගත කිරීමයි
(3) ඉරිදා පැවති තරගයකට ගම නියෝජනය කිරීමය
(4) රැකියාවට යැමට පෙර තම ආරක්ෂාව වෙනුවෙන් යාච්ඤා කිරීමයි

(28) වර්තමාන කිතුනු කාන්තාවගේ ප්‍රධාන භූමිකාව විය යුත්තේ,

(1) කිතුනු උත්සව සඳහා සංග්‍රහ කිරීමයි
(2) කාන්තා සමිති තුළින් ක්‍රියාකාරී වීමය
(3) දේවැගැතිවරියන් වීමට ඉල්ලුම් කිරීමයි
(4) හැකි සෑම විටම කිතුනු මෙහෙවරේ යෙදීමයි

(29) එදා ජේසුතුමා පවසු පරිදි විනයධරයන්ගේ ඇතුළාන්ත හිස්කම, අද දිස්වන්නේ,

(1) මාපියන් නොසළකන දරුවන් ඔවුන් මියගිය පසු ස්මාරක තනන විටය
(2) සමහරුන් වැඩිහිටි නිවාස වලට යන විටය
(3) සමහරුන් විශේෂ අවස්ථා වලදී දේව නමස්කාරයේ යෙදෙන විටය
(4) සමහරුන් නොකඩවා ම දන්දීමෙහි යෙදෙන විටය

(30) අපලාප කළ පේදුරුට **ප්‍රතිවිරුද්ධ** විය යුතු කිතුනුවා,

(1) ප්‍රශ්න මැද නිහඬ විය යුතුය
(2) අන්‍යයින්ගේ අදහස් බැහැර කළ යුතුය
(3) තම ක්‍රියා සාධාරණීකරණය කළ යුතුය
(4) තම සුරක්ෂිතභාවය නොසැලකිය යුතුය

(31) සිය මුල් ජීවන පසුබිම නිසා සාවුල්ගෙන් දහම් සේවය ලැබූ වරප්‍රසාදයක් වූයේ කුමක්ද? ,

(1) අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා වීමයි
(2) අන්‍ය ජාතික පරිසරයක විවිධ සංස්කෘති මධ්‍යයේ ජීවත් වීමයි
(3) ඔහුට පමණක් කූඩාරම් තැනීමේ ක්‍රියා කලාපයයි
(4) ක්‍රියාකාරී ධර්ම දේශකයෙකු වීමයි

(32) ජේසුතුමා සමග ජීවත්වන තරුණ අය ජීවිත පෙරළියක් සඳහා,

(1) නිර්මල වූත් සදාචාරාත්මක වූත් දිවියකට පිවිසිය යුතුය.
(2) සමාජයේ තරඟකාරීත්වයට ඇතුළු විය යුතුය.
(3) සැමවිටම නායකත්ව භූමිකාවක් රඟ පෑ යුතුය.
(4) අයහපත් මිතුරු ආශ්‍රයෙන් වැළකිය යුතුය.

(33) එදා ජුදෙව් සමාජයේ පැවති, වත්මන් කිතුනු සභාවේ දක්නට **නොලැබෙන** අංගයක් වනුයේ,

(1) ශුද්ධ ලියවිලි දේව ආනුභාවයෙන් ලියැවුණු බව පිළිගැනීමයි.
(2) ආගන්තුක සත්කාර කිරීමයි
(3) මොසෙස්ගේ නීතිය බාහිර ලෙස අකුරට පිළිපැදීමයි
(4) පරම්පරානුගත ඉඩම් බෙදා දීමයි

(34) "පළමුකොට ඔබේම ඇසෙන් ලී කොටය ඉවතලන්න." ජේසුතුමාගේ මෙම ඉගැන්වීම් අවධාරණය කළ යුත්තේ,

(1) කෙනෙකුගේ ක්‍රියාවක් විවේචනය කිරීමට සිතන විට ය.
(2) කෙනෙකුගේ හොඳ ක්‍රියාවක් සැඟවීමට සිතෙන විට ය.
(3) කෙනෙකුගේ දස්කමක් ප්‍රසිද්ධ කිරීමට සිතෙන විට ය.
(4) කෙනෙකු ගැන ප්‍රශංසාවක් කිරීමට සිතෙන විට

(35) පහත දැක්වෙන කරුණු සලකා බලන්න

A. නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීම
B. අභියෝග ඉදිරියේ නොසැලී සිටීම
C. හාස්කම් මත පමණක් රැඳී සිටීම
D. අත්දැකීම් පෙරටුකර ගෙන සාක්ෂි දැරීම

මින් කිතුනු මෙහෙවර සඳහා පාවුල්ගේ මග පෙන්වීම් ලබන කිතුනුවාගේ කාර්යභාරය විය යුත්තේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A,C හා D ය. (4) B,C හා D ය.

(36) කිතුනු බලාපොරොත්තුව පිළිබඳව පහත දැක්වෙන කරුණු කීපය සලකා බලන්න.

A. සදාතන ජීවනය ලැබීම
B. ජේසුතුමාගේ දෙවන පැමිණීම
C. පැරණි ගිවිසුමේ පොරොන්දු ඉටු කිරීම
D. මෙසියස් සේවය පිළිබඳ ධර්මදූත සේවය නවතාවයට ගෙන ඒම

මින් කිතුනු බලාපොරොත්තුව පිළිබඳ වඩාත් යෝග්‍ය කරුණු වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(37) පහත දැක්වෙන කරුණු සලකා බලන්න.

A. සියලු වහල්භාවයන් පිටු දැකීම
B. ස්වභාව ධර්මය අගය කිරීමට පෙළඹවීම
C. පැරණි ගිවිසුමේ පොරොන්දු ඉටුකිරීම
D. බෙදීම් ඉක්මවා යන නව අනන්‍යතාවයක් ඇති කිරීම

මින් බහුවිධ සමාජය තුළ සාමය හා සහජීවනය ඇති කිරීමේ මූලික ප්‍රයත්න විය යුත්තේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(38) අධ්‍යාත්මික හා ආර්ථික දරිද්‍රතාව නැති කළ **නොහැක්කේ,**

(1) සහනාධාර කටයුතු පුළුල් කිරීමේ දුෂ්කරතා නිසාය
(2) භෞතික දෑ විනාශ වන බව පිළිගැන්වීමේ දුෂ්කරතා නිසාය
(3) සම්පත් නාස්තිය වැළැක්වීමේ දුෂ්කරතා නිසාය
(4) යුක්තිය හා සමානත්වය ඇති කිරීමේ දුෂ්කරතා නිසාය

(39) පහත දැක්වෙන කරුණු සලකා බලන්න.

A. අලංකාර දේව මාළිගය රැක ගැනීම

B. ප්‍රීතියෙන් සාක්ෂි දැරීම

C. යුගාන්තයේදී ජයාන්විත භාවයෙන් සහභාගී වීමේ බලාපොරොත්තුව

D. ස්භාවික ආපදා යුගාන්ත ලකුණු සේ දැකීම

මින් යුගාන්තය පිළිබඳ අනාවැකි මගින් ජේසුතුමා අවධාරණය කළ කරුණු වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(40) ආගන්තුක සත්කාරය පිරිනැමීම පිළිබඳව ජේසුතුමා දුන් ඔවදනක් වන්නේ කුමක්ද?,

(1) "ඔබ කැඳවනු ලැබූ කල ගොස් පහත්ම ස්ථානයෙහි හිඳගන්න."
(2) "දිළිඳුන් ද අබ්බගාතයන් ද කොරුන්ද කැඳවන්න."
(3) "දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි කෑම වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකි."
(4) "තමන් පහත් කර ගන්නා උසස් කරනු ලැබේ."

**ක්‍රිස්තියානි ධර්මය 11**

පළමු ප්‍රශ්නය හා තවත් තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**1. ප්‍රශ්න**

**1.ගාබ්‍රියෙල් දේවදූතයාගේ විශේෂ උපත් පිළිබඳ ශුභ ආරංචි ලැබූ දෙදෙනා නම් කර,ඔවුන්ගේ ප්‍රතිචාර මොනවාදැයි දක්වන්න.**

සෙකරියස් පුදුමයට පත්වීමෙන් හා විශ්වාස කිරීමට නොහැකි වීමෙන් ගොළුවීම,මරියතුමී යටහත් පහත්ව දේව අණට යටත් වීම. **ලකුණු 02**

**2."ගොයම නම් බහුලය. ගොවිහු විරලය. එබැවින් මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ හිමියන්ට යාච්ඤා කරන්න."**

**I. ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කාටද?**

ජේසුස් වහන්සේ ධර්ම දූත සේවකයන් 70 දෙනාට පැවසූ සේක. **ලකුණු 01**

**II. තද කළු අකුරෙන් යෙදී අති පද පැහැදිලි කරන්න.**

ගොයම - වචනය ඇසීමට ඇති ජනයා, **ගොවීහු** - ධර්මදූත සේවකයන්

**ලකුණු 01**

**3. (a) "විද්‍යාවේ යතුර හිමියන්"ලෙස ලක් සුහසුනේ සඳහන් වන්නේ කවුරුන්ද?**

විනයධරයන් **ලකුණු 01**

**(b) ඔවුන්ගේ බරපතල වරද ලෙස ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ කුමක්ද?**

ව්‍යවස්ථාවට අටුවාටිකා එකතුකර එයින් ජනතාව නීතියෙන් පීඩනයට පත්කිරීම

**ලකුණු 01**

**4. ජේසුස් වහන්සේ සේවය කළ සමාජයේ දරුවන්ට නිසි ගෞරවයක් හා පිළිගැනීමක් ලබා දීමට**

(a) මව්වරුන් දරුවන් එතුමා වෙත ගෙන ආ අවස්ථාවේදී ඔවුන් පිළිගෙන ආශිර්වාද කරමින් "ස්වර්ග රාජ්‍යය මෙබඳුවන්ගේ යැයි පැවසීම"

(b) දේව රාජ්‍යයේ උතුම් තැනැත්තා කවරෙක්දැයි ගෝළයන් ප්‍රශ්න කළ අවස්ථාවේදී කුඩා දරුවෙක් ගෙන - දරුවෙක් ලෙස ක්‍රියාකරන්නේ නම් දේව රාජ්‍යය හිමි බව පැවසීම.

(c) දරුවෙක් නොමග යවන කෙනෙක් ඇඹරුම් ගලක් ගෙල වටා එල්ලා ගිල්වනු යහපතැයි කීමෙන් දරුවන්ගේ වැදගත්කම ඉදිරිපත් කළ සේක.

**ලකුණු 02**

**5."මුළු ඉශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත."**

**(a) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කවරෙක් පිළිබඳවද?**

රෝම ශතාධිපතියාගේ විශ්වාසය පිළිබඳවය

**ලකුණු 01**

**(b) එයින් කිතුණු අප ලබන ආදර්ශය කුමක්ද?**

පූර්ණ ඇදහිල්ල, විශ්වාසය නිහතමානීකම ඔහුගේ ඉල්ලීම සාර්ථක වූ ලෙස අන් අයටත් එම ගුණාංග මගින් බලාපොරොත්තු ඉටු කර ගැනීමට මග පෙන්වීම.

**ලකුණු** 01

6. **"ඔබේ ඉඟපටිය බැඳගන්න." පහන් දල්වා තබා ගන්න."**

**මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින්ද? එයින් අදහස් කෙරෙන්නේ කුමක්ද?**

ජේසුස් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයක්, නිතරම සූදානමින් සිටිමින් දෙවන පැමිණීම අපේක්ෂා කළ යුතු බවය. **ලකුණු** 01

7. **(a) ගීතාවලියේ 23 වන ගීතයෙන් බැටළු එඬේරාණන් වශයෙන් දැක්වෙන්නේ කා පිළිබඳවද?**

23 වන ගීතයේ "යහපත් බැටළු එඬේරා ලෙස දැක්වෙන්නේ දෙවියන් වහන්සේය/ස්වාමින්වහන්සේය"

**ලකුණු** 01

**(b) ජේසුස් වහන්සේ "යහපත් බැටළු එඬේරා"යන සංකල්පය පරිපූර්ණ කළේ කෙසේද?**

ජේසුස් වහන්සේ සිය ජීවිතය බැටළුවන් එනම් අපේ පාප උදෙසා පිදීමෙන්ය.

**ලකුණු** 01

8. **ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න.**

**(a) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක්ද?**

සිය ගෝලයන්ට ගෙත්සෙමන උයනේ ජේසුස් වහන්සේගේ මරණයට පෙර යාච්ඤා කිරීමට ගිය අවස්ථාවේදීය.

**ලකුණු** 01

**(b) එයින් ඉදිරිපත් කළ අර්ථය කුමක්ද?**

යාච්ඤාව මගින් පරීක්ෂාවෙන් මිදීමට හා ජය ගැනීමට හැකි බව **ලකුණු** 01

9. **(a) ජෙරුසෙලමේ මන්ත්‍රණ සභාවේ අරමුණ කුමක්ද?**

ජුදව් හා ජුදෙව් නොවන (අන්‍ය ජාතීන්)කිතුණු දහම වැළඳ ගත් කළ ඔවුන් සමග එකට සහභාගීකම පැවැත්වීමට ජුදෙව්වන් මැලි වූ අවස්ථාවේ ඒකත්වය ගෙන ඒම සඳහාය. විජාතීන් චර්මච්ජේදනය සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළුව නිසා

**ලකුණු** 01

**(b) එහි නායකත්වය දැරුවේ කවුද?**

ජාකොබ් හා පේදුරු

**ලකුණු** 01

10. **කිතුණු පවුලක් සාර්ථක ව කරගෙන යාම සඳහා දෙමව්පියන්ගෙන් හා දරුවන්ගෙන් බලාපොරොත්තු වන වගකීම් එක බැගින් ලියන්න.**

දෙමාපිය දෙදෙනා අතර සහයෝගය හා ප්‍රේමය සියළු දරුවන් එකම තත්වයෙන් පිළි ගැනීම හා දරුවන් දෙමාපියන්ට දක්වන කීකරු බව හා සත්‍ය බව.

**ලකුණු** 02

**(2) 1.“මෙසියස්” යන්නෙහි අර්ථය කුමක්ද? ජෙරුසෙලමේ දේව මාළිගයේ දී ජේසු බිළිඳා මෙසියස් ලෙස හඳුනාගත්තේ කවුරන් විසින්ද?**

ආලේප ලත් තැනැත්තා
සිමියොන් සහ අන්නා විසින්

**ලකුණු 02**

**2. ජේසුස් වහන්සේ වහන්සේගේ දෙමව්පියන් එතුමා සම්බන්ධයෙන් ඉටු කළ ජුදෙව් චාරිත්‍ර තුනක් ලහුඬින් ඉදිරිපත් කරන්න.**

1. අට වැනි දින චර්මඡේදනය සහ නම් තැබීම
2. සතලිස් වන දින කැප කිරීම
3. දොළොස් වියේදී (පාස්කු මංගල්‍යය)පසුකර යෑමේ මංගල්‍යය සඳහා ජේරුසෙලමේ දේව මාළිගයට ගෙන යෑම

**ලකුණු 03**

**3. ශ්‍රී ලාංකික සමාජය තුළ කිතුණු ආගමික චාරිත්‍ර හා කිතුණු ආගමික චාරිත්‍ර හා කිතුණු අනන්‍යතාවය රැකගෙන අන් අය ආකර්ෂණය වන පරිදි ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද?**

බෞතිස්මය - ළදරු වියේදී හෝ වැඩිහිටි වියේ දී සිදු කිරීම,වතුරෙන් දෝවනය හා ශුද්ධාත්ම දානය දින බලාපොරොත්තු වීම

නම් තැබීම - එදින දරුවාට නම් තැබීමෙන් දේව මැදුරට පිළිගැනීම

නව නිවසට පිවිසීමේදී - කිරි ඉතිරවීමෙන් ශුද්ධ ලියවිලි පාඨ කියවා ආශිර්වාද පැතීම

නත්තල් උත්සවයේදී - තෑගි හා කැවිලි නැතිබැරි අය සහ අන්‍ය ආගමිකයන් සමග බෙදා ගැනීමෙන් සහයෝගය හා නත්තල් සාම පුවත ඉදිරිපත් කිරීම.

මෙබඳු ප්‍රශ්නයට අදාළ කර වෙනත් උත්සව ලියා ඇත්නම් ලකුණු දෙන්න.

**ලකුණු 05**

**(3) 1. ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹුයේ කුමන නගරයෙන්ද? සිය සේවය ගැන ධර්ම ශාලාවේදි උන් වහන්සේ කියැවූයේ කුමන දිවැසිවර ග්‍රන්ථයද?**

සේවය ඇරඹුයේ ගලීලයේ නාසරත් නුවරය
දිවැසිවර යෙසායගේ ශුද්ධ ලියවිලි පාඨය කියැවූ සේක

**ලකුණු 02**

**2. ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳව උන්වහන්සේ කියැවූ පාඨයේ අඩංගු විශේෂිත කරුණු, උන්වහන්සේගේ සේවයේදී ඉටු කළ අන්දම උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න.**

දුප්පතුන්ට ශුභාරංචිය - ජේසුස් වහන්සේ එළිමහන් තැන් වල දුගී දුප්පත් ජනතාව අමතා දේශනා කළ සේක. ඔවුන්ට නව බලාපොරොත්තු ලබාදුන් සේක.

පීඩිතයන් ට ගැළවීම - විවිධ නීති බඳු බර නිසා පීඩාවට පත්ව සිටි ජනතාවට සහනය ලබා දීමට ක්‍රියා කළ සේක.

වහලුන්ට මිදීම - ව්‍යවස්ථාව නිසා වහල් බවට පත්ව සිටි කාන්තාවන්, දරුවන්, රෝගීන් සමාජ තහංචි බිඳ දමා සමජයට පිවිසීමට ඉඩ සැලසීම

අන්ධයන්ට පෙනීම - ශාරීරික ඇස් අන්ධ අයට පෙනීම ලබා දීම හා ඔවුන් අනුගාමිකයන් වීම. පාපය නිසා අන්ධ බවට පත්ව සිටින අය, බදු අය කරන්නන්, පරිසිවරුන්ට වරද පෙන්වා හරි මගට යොමු කිරීම, ගෝලයන්ට පවා සත්‍ය මාර්ගය වටහා දුන් සේක.

**ලකුණු 03**

**3. ඉහත (2) ව අදාළ ව ඔබ විසින් දක්වන ලද, වත්මන් සමාජයේ ද දක්නට ලැබෙන අවස්ථා ඉදිරිපත් කර, කිතුණුවන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග කවරේදැයි පැහැදිලි කරන්න.**

දුප්පත් අය - ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට පිහිට වීමෙන් සුබසුන ක්‍රියාත්මක වේ.

පීඩිතයන් - කම්කරුවන්, විවිධ කර්මාන්තශාලා හෝ සරණාගතව සිටින අය, වතුකරයේ ශ්‍රමය යොදන්නන්, විදේශ රැකියාවල නියුතුව පීඩාවට පත්ව සිටින අය සඳහා හඬක් නැගීමෙන් පීඩාවට පත් කරන අයගෙන් ඔවුන්ට සහනයක් ලබාදීම

වහලුන් - ධනයට, බලයට, ලෞකික, දේට වහල් වී සිටින (මත්ද්‍රව්‍ය බීමත්කම ආදිය)පරිසවලට එම තත්වයන්ගෙන් මිදීමට මග පෙන්වීම. පුනරුත්තාපනයට යොමු කළ හැකි අවස්ථා වල, දේවස්ථාන හෝ සමාජයේ කිතුණු සංගම් මගින් මඟ පෙන්වීම.

අන්ධයන් - පාපයට ලක්ව සිටින දේව වචනයට අන්ධව ක්‍රියා කරන අය වෙනුවෙන් යාච්ඤා කිරීම, බයිබල් අධ්‍යයනයට යොමු කිරීම.

**ලකුණු 05**

**මුළු ලකුණු 10**

**(4) මානව හිමිකම් ගිලිහි ගොස් ඇති බව අපට නිතර දක්නට ලැබේ.**

**1. ජේසුස් වහන්සේ මෙලොව සේවය කළ කාලයේදී හිංසනයට හා පීඩනයට ලක්වී සිටි ජන කොටස් දෙකක් ගැන ලුහුඬින් පැහැදිලි කරන්න.**

හිංසනයට පීඩනයට ලක්ව සිටි ජන කොටස් කාන්තාවන්, දුගී අය, රෝගීන්,(මානසික)දුෂ්ට ආත්මවලින් පෙළුන අය,පව්කරුවන්

**ලකුණු 02**

**2. ජේසුස් වහන්සේ එබඳු ජන කොටස් වෙනුවෙන් ක්‍රියාකර,ඔවුන්ට සමාජ හිමිකම් ලබා දුන් අවස්ථා තුනක් සඳහන් කරන්න.**

I. රෝගීන් සුවකර සමාජයට ගැනීම
II. පව්කරුවන්ට සමාව දීමෙන් නව මඟකට යොමු කිරීම
III. ප්‍රතික්ෂේපයට ලක්ව සිටි සමාරිතයන් වැනි පිරිස් පිළිගැනීම
IV. කාන්තාවන් පවා ගෝල පිරිසට එක්කර ගැනීම හා දේව රාජ්‍යයේ වැඩට සහභාගි කරගැනීම

**ලකුණු 03**

**3. ශ්‍රී ලාංකික ජන සමාජයේ ජනතාව මුහුණපාන හිංසන හා පීඩන පහක් සඳහන් කර,එබඳු අවස්ථා වල කිතුණු ප්‍රතිචාරය කෙසේ විය යුතු දැයි පහදන්න.**

ස්භාවික ව්‍යසනයන් - සරණාගත කඳවුරුවල පසුවන අය ඔවුනට මානසික සුවය ලබාදී යලි ජීවිත ගොඩ නගා ගැනීමට සහය ලබා දීම

ස්ත්‍රී දූෂණය - ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපක්ෂයම දැනුවත් කිරීමේ ව්‍යාපෘති වල යෙදීම

ළමා අපයෝජනය - දරුවන් රැකගැනීමට නිසි අවවාද හා ප්‍රචාරක කටයුතු දියත් කිරීම

වතුකරයේ ජනයා/ කම්හල්වල ඔවුන්ට නිසි වැටුප් හා පහසුකම් සපයා දීමට ඔවුන් සේවක

සේවිකාවන් -   වෙනුවෙන් හඬක් නැගීම

ආර්ථික වශයෙන් රැකියා නොමැතිව  - දුගී බවට පත්ව සිටින අය

ඔවුන්ගේ ආර්ථිකය තත්වය නගා ලීමට තම දේවස්ථානය හෝ එබඳු සංගම් මඟින් දායක වීම

ලකුණු 05

මුළු ලකුණු 10

**(5) 1.ශුද්ධ වූ පාවුල්තුමා රෝමයට සිරකරුවෙකු ලෙස ගිය ගමනේ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලුහුඬින් ලියන්න**

I. පාවුල් රෝමයට ගමන් කළේ තවත් සිරකරුවන් පිරිසක් සමගයි.
II. සයිප්‍රසය අසළ සිට සුළඟට විරුද්ධව යෑම,යාත්‍රා කිරීම,අනතුරු බව පැවසීම,පාවුල් දුන් අවවාද නොතකා නැව්පතියා ඉදිරියට යෑම.
III. ක්‍රීටයේ වෙරළ අසළ චන්ඩ මාරුතයට මුහුණ පෑම,නැව සුළඟින් ගසා ගෙන යෑම.
IV. බොහෝ දෙනෙක් කෑම නොකා බියෙන් ජීවිත හානිය ගැන තැකීම.
V. සැඩ පහරින් ගසා ගිය නැව වැලි කණ්ඩියක හැපී බිඳුනේය.
VI. සිරකරුවන් බේරී නොයෑම සඳහා ඔවුන් මැරීමට තීරණය කිරීම.
VII. එහෙත් පාවුල් බේරීම සඳහා ඒ අදහස ඉවත් කර සියලු දෙනාම අසළ තිබූ දිවයිනට පිහිනා යෑමට අවසර ලැබීම.
VIII. එහිදී ශීතට ගිනි තැපීමේදී සර්පයෙකු පාවුල්ගේ අතේ එල්ලීම,මිනී මරුවෙක් යැයි එවිට සියළු දෙනා සිතීම.

ලකුණු 02

**2. අර්බුධය මැද පාවුල්තුමා ආදර්ශමත් නායකත්වයක් දුන් අන්දම පහදන්න.**

පාවුල් දුන් ආදර්ශමත් නායකත්වය :

- සිරකරුවෙකු ලෙස ගමන් කලද දේශගුණය අනුව නැව යාත්‍රා කිරීම අසීරුතාවය හා අනතුරු බව නැවියන්ට කීම.
- බඩු හා ජීවිතවලට හානියක් පැමිණිය හැකි බව දැනුවත් කිරීම
- සෙසු නැවේ ගමන් කළ සිරකරුවන් දිරිමත් කරමින් ආහාර ගැනීමට අවවාද කිරීම
- තමා අදහන දෙවියන් වහන්සේ කිසිවෙකුට ජීවිත හානියක් නොවන බව දැන් වූ සේක කියා සාක්ෂි දැරීම. රොටී රැගෙන සියල්ලන් ඉදිරියේ කඩා බෙදා දීම.

මෝල්ටාවේ ජනයා ඔවුනට දැක් වූ සත්කාර වෙනුවෙන් පාවුල් සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වී නායකත්වය ගෙන පබ්ලියැගේ පියා සහ වෙනත් රෝගීන් සුවපත් කිරීම.

ලකුණු 03

**3. පාවුල්තුමාගේ එම ආදර්ශය අනුව කිතුණු අප අර්බුදකාරී තත්ව ඉදිරියේ කෙසේ ක්‍රියා කළයුතුදැයි විස්තර කරන්න.**

අර්බුධකාරී තත්වයක් ඉදිරියේ - අප ක්‍රියා කළ යුතු ආකාරය

- ක්ෂණිකව ක්‍රියා කර අන් අය උදෙසා ඉදිරිපත් වීම
- නායකත්වය ගෙන සෙසු අය දිරි ගැන්වීම
- ධෛර්යෙන් වැඩ කිරීම හා අවවාද දීම
- දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම
- අර්බුදයට මුහුණ දෙන අය උදෙසා යාච්ඤා කිරීම

ලකුණු 05

මුළු ලකුණු 10

**(6) 1. ජේසුස් වහන්සේ විසින් සීමොන් පේදුරු සහ මතෙව් කැඳවූ අවස්ථාවේදී ඔවුන් දැක්වූ ප්‍රතිචාරය කෙසේ වීද?**

- සීමොන් පේදුරුගේ ප්‍රතිචාරය - තමාගේ නොවටිනාකම ජේසුස් වහන්සේ ඉදිරියේ කියා පෑම හා උන්වහන්සේ දුන් නව සේවය සඳහා අනුගාමී වීම.
- මතෙව් - සුංගම් පොළේදී කැඳවීම ලැබීම, ඔහු ක්ෂණිකව ප්‍රතිචාර දක්වා ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙක් වීම.

**ලකුණු 02**

**2. ජේසුස් වහන්සේ එදා ජුදා සමාජ තත්වය ඉක්මවා ශ්‍රාවකයන් කැඳවීමේ හා එහි සංයුතියේ විශේෂිත වූ ලක්ෂණ තුනක් ඉදිරිපත් කරන්න.**

ජේසුස් වහන්සේ ගෝලයන් කැඳවීමේ සුවිශේෂ ලක්ෂණ

I. ඔවුන්ගේ රැකියා ස්ථානයට ගොස් කැඳවීම
II. තරාතිරම් නොබලා සමාජයේ විවිධ කොටස් තෝරා ගැනීම
III. කාන්තා පිරිසක්ද ගෝලයන් / අනුගාමිකයන් ලෙස කැඳවීම
ඊශ්‍රායලයෙන් ගෝත්‍ර 12 සංකේතවත් කිරීම සඳහා ගෝලයන් 12ක් කැඳවීම

**ලකුණු 03**

**3. වත්මන් සමාජය උදෙසා කිතුණු අනුගාමිත්වය දරණ අපගෙන් ජේසුස් වහන්සේ බලාපොරොත්තු වන්නේ මොනවා දැයි පැහැදිළි කරන්න.**

කිතුණු ශ්‍රවකයන් ලෙස වත්මන් සමාජය උදෙසා ඇති අපේක්ෂා

- සියළු ජන කොටස් භේදයෙන් තොරව ඇසුරු කිරීම
- සමාජයේ කොන්වීමට ලක් වූවන් උදෙසා සේවයක් කිරීම
- රෝගී අවස්ථාවල එබඳු අයට පිහිට වීමට යාච්ඤා කිරීම
- තමන්ගේ හැකියා තලෙන්ත සමාජ යහපත උදෙසා භාවිතය
- ප්‍රේමය කරුණාව දක්වමින් කැප වූ සේවයක යෙදීම
- දේව වචනයෙන් අවශ්‍ය අවස්ථා වල දිරිගැන්වීම

**ලකුණු 05**

**මුළු ලකුණු 10**

**(7) 1. පරිසිවරු ජුදා සමාජයේ කෙබඳු තත්වයක් දැරුවේද? ඔවුන්ගේ ආගමික කටයුතු වල මධ්‍යස්ථානයක් වූයේ කුමක්ද?**

පරිසිවරු සමාජයෙන් වෙන් වූ පිරිසක් ලෙස සිටීම,ඔවුන් සමාජයේ විශාල කණ්ඩායමක් විය. ආගමික බලය ලත් පිරිසක් වීම.
සිනගෝගය/ධර්ම ශාලා/ඔවුන්ගේ ආගමික කටයුතු මධ්‍යස්ථානය විය.
නීතිය/ ව්‍යවස්ථාව පහදා දීම,කට වහරෙන් නව නීති එකතු කිරීම,ප්‍රසිද්ධියේ තම ධාර්මික භාවය දැක්වීම.

**ලකුණු 02**

**2. සීමොන් පරිසිවරයාගේ නිවසේදී ජේසුස් වහන්සේ පිළිගැනීමේදී පැහැර හරින ලද ජුදා චාරිත්‍ර තුනක් ලියන්න.**

- පාද සේදීමෙන් පිළිගැනීම
- තෙලින් හිස ආලේප කිරීම
- සිඹීමෙන් නිවසට පිළිගැනීම

**ලකුණු** 03

**3. පරිසිවරුන්ගේ පුහු ධාර්මිකභාවය හෙළා දකිමින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ ආකාරය අනුගමනය කරමින් කිතුනු අප සමාජයේ ක්‍රියා කළ යුතු ආකාරය කරුණු පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

දන්දීම වැනි කාරුණික කටයුතු නිහඬව /රහසිගතව කිරීම/ආගමික වතාවත් ප්‍රසිද්ධියට නොව දේව ගෞරවය උදෙසා කිරීම ශ්‍රී ලාංකික අගනා චාරිත්‍ර සමාජයේ අන් අය සමග එකතු වී කිතුනු අනන්‍යතාවය රැකගෙන

තමාට විරුද්ධව ක්‍රියා කරන අය උදෙසා යච්ඤා කිරීම

එබඳු අයට සමා වීමෙන් කරුණාව දැක්වීම
උදම් නොවී නිහතමානි සේවයක යෙදීම
(මෙවැනි සුදුසු පිළිතුරුවලට ලකුණු දිය යුතුයි)

**ලකුණු** 05
**මුළු ලකුණු** 10